# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 ඔක්තෝබර් මස 06 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 ඔක්තෝබර් මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත

[සහතිකය සටහන් කළේ 2010 ඔක්තෝබර් මස 06 වැනි දින]

එල්.ඩී.—ඕ.—59/2006.

**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයක් පිහිටුවීම සඳහා ද, එම ආයතනයේ පරිපාලනය සඳහා පාලක මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද, තාක්ෂණ කමිටු පිහිටුවීම සඳහා ද, වෘත්තීය සමිති අධ්‍යයන අංශයක් පිහිටුවීම සඳහා ද, පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම හා ශ්‍රී ලංකාවෙහි කම්කරු අධ්‍යාපනය ප්‍රවර්ධනය අරභයා පුහුණුව සැපයීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත, 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

## ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය පිහිටුවීම

**2.** (1) ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබිය යුතු ය. — ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය පිහිටුවීම

(2) ආයතනය (1) වන උප වගන්තියේ ඊට දී ඇති නාමයෙන්, සංස්ථාවක් වන්නේ ය. ඊට අඛණ්ඩ පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති අතර එය විසින් හා එයට විරුද්ධව එම නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

**3.** ආයතනයේ අරමුණු පහත සඳහන් පරිදි වන්නේ ය:— — ආයතනයේ අරමුණු.

(අ) දේශීය හෝ විදේශීය ආයතන සමග සහයෝගිත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ ශුභසාධනය සහතික කරනු පිණිස පියවර ගැනීම;

2—PL 005148—3,340 (2010/08)

(ආ) ශ්‍රම අධ්‍යයනය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරීම;

(ඇ) පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාළ පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම;

(ඈ) පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම;

(ඉ) මේ හා සමාන අරමුණු සහිත, ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සමග සමීප සහයෝගිත්වයෙන් කටයුතු කිරීම;

(ඊ) විශ්වවිද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහාය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවල දී සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම; සහ

(උ) කාර්මික සමගිය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම.

ආයතනයේ බලතල.

**4.** ආයතනයට එහි අරමුණු හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වියහැකි බලතල තිබිය යුතු අතර, විශේෂයෙන් පහත සඳහන් සියලු ක්‍රියා හෝ ඉන් කිසිවක් හෝ කිරීම සඳහා බලය තිබිය යුතු ය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීම;

(ආ) කවර හෝ බැංකුවක හෝ බැංකුවල ජංගම ගිණුම්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වුව ද තැනැත්තන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ඈ) ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීම හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම හෝ ඒවා ඉටු කිරීම;

(ඉ) යොදවා නොමැති යම් මුදල් ඇතුළුව ආයතනයට අයත් යම් මුදල් යම් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හෝ එවැනි යම් මුදල් ශ්‍රී ලංකාවෙහි නිශ්චල දේපළ මිලදී ගැනීම පිණිස ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජන වෙනස් කිරීම හෝ වහාම වියදම් සඳහා අවශ්‍ය නොවන ඒ මුදලින් යම් කොටසක් යම් බැංකුවක ස්ථාවර තැන්පතු වශයෙන් තැන්පත් කිරීම;

(ඊ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වියහැකි මුදල් ප්‍රමාණයන් ණයට ගැනීම;

(උ) ආයතනයේ අරමුණුවලට සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු සහිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි වෙනත් ආයතන සමග පුද්ගලයන් හුවමාරු කර ගැනීම හා පුහුණු කිරීම, පර්යේෂණ හා උපදේශක සේවා පිළිබඳ සහ සාමාන්‍යයෙන් ඔවුනොවුන්ගේ පොදු අරමුණු ඉදිරියට ගෙන යාම පිණිස විය හැකි යම් කාර්ය සඳහා ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඌ) මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයේ යෙදවීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන්ගේ විනය පාලනය හා ඔවුන් සේවයෙන් පහ කිරීම;

(එ) ආයතනය විසින් සපයන සේවා සහ උපකාර සඳහා ගාස්තු අය කිරීම; සහ

(ඒ) ආයතනයේ මතය අනුව, එහි කර්තව්‍ය ඉටු කිරීම පහසුකරවීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

ආයතනයේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරෙන බව.

**5.** (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය සහ පාලනය (මෙහි මින් මතු “ මණ්ඩලය” යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ පාලක සභාව වෙත පැවරෙන්නේ ය.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනත මගින් ආයතනය වෙත පැවරී ඇති, නියමවී ඇති හෝ භාරවී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදිය හැකි ය; ඉටු කළ හැකි ය; කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සංයුතිය.

**6.** (1) මණ්ඩලය, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් හයදෙනකුගෙන්, එනම්—

(i) කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ii) කම්කරු කොමසාරිස් ජනරාල්වරයා;

(iii) කාර්මික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙක්;

(iv) භාණ්ඩාගාරයේ නියෝජිතයෙක්;

(v) ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද, විශ්වවිද්‍යාලවල නියෝජිතයෙක්; සහ

(ආ) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන (මෙහි මින් මතු “පත්කළ සාමාජිකයන්” යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් දහතුන්දෙනෙක්—

(i) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ධුරයක් දරන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්;

(ii) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්;

(iii) වෘත්තීය පුහුණු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරයට පහළ ධුරයක් නොවන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයෙක්;

(iv) වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයන් සිව්දෙනෙක්;

(v) සේවායෝජකයන් නියෝජනය කරන සාමාජිකයන් සිව්දෙනෙක්; සහ

(vi) ශ්‍රම අධ්‍යයන ක්ෂේත්‍රයේ ප්‍රකට සාමාජිකයන් දෙදෙනෙක්.

(2) අමාත්‍යවරයා විසින් කම්කරු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලයේ උපසභාපතිවරයා වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා පත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා සහ උපසභාපතිවරයා අවුරුදු තුනක කාලයක් ධුරය දරනු ලැබිය යුතු ය. ඔවුහු නැවත පත් කිරීමට සුදුසු වන්නේ ය.

(4) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සභාපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් කාර්ය ඉටු කිරීම සඳහා උපසභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(5) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා උපසභාපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් කාර්ය ඉටු කිරීම සඳහා වෙනත් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් තැනැත්තෙක්—

(i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු බවට පත් වුවහොත් ; හෝ

(ii) ආයතනය විසින් හෝ ආයතනය වෙනුවෙන් හෝ එළඹ ඇති යම් ගිවිසුමක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිලාභයක් ඍජුව හෝ වක්‍රව දරන්නේ නම් හෝ භුක්ති විඳින්නේ නම් ; හෝ

(iii) ඒ තැනැත්තාහට මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑහැකි යම් මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් තිබේ නම්,

ඒ තැනැත්තා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එසේ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුස්සකු වන්නේ ය.

(7) පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ මණ්ඩලයේ සාමාජිකයන් පනතේ 6 වන වගන්තිය යටතේ මණ්ඩලය නැවත පත් කරන තාක් ධුර දැරිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය.

**7.** ආයතනයේ අරමුණු හා සම්බන්ධ යම් කාරණයක් හෝ සියලු කාරණා පිළිබඳව ද අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ උපදෙස් සඳහා යොමු කරනු ලබන එවැනි යම් කාරණයක් පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම මණ්ඩලයේ කාර්ය විය යුතු ය.

මණ්ඩලය වෙත විශේෂ හෝ පොදු විධාන නිකුත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

**8.** (1) මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාවේ යෙදීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් විශේෂ හෝ පොදු විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා යම් වෘත්තීය සමිති සාමාජිකයකු ගාස්තුවක් ගෙවීමෙන් නිදහස් කළ හැක.

ධුර කාලය.

**9.** (1) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය බව අමාත්‍යවරයා සලකන්නේ නම්, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින්, ඒ සාමාජිකයා හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ යම් සාමාජිකයකු සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ දී ඒ සාමාජිකයා ඔහුගේ ධුරය හිස් කළ යුතු ය.

(4) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු විසින් අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ ධුරයෙන් කවර හෝ වේලාවක දී ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් ඇතිවුවහොත්, එවිට ඒ පුරප්පාඩුව පිරවීම සඳහා 6 වන වගන්තියේ විධිවිධාන පිළිබඳව සැලකිලිමත්ව, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) පත් කළ සාමාජිකයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ඇති වූ පුරප්පාඩුවක් පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු අනුප්‍රාප්ත වන්නේ මණ්ඩලයේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය තුළ ඔහු ධුරය දැරිය යුතු ය.

(7) යම් පත් කළ සාමාජිකයකු රෝගාතුර වීම, අබලතාවට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ඔහුට මාස තුනකට නොඅඩු කාලයකට ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා 6 වන වගන්තියේ විධිවිධාන පිළිබඳව සැලකිලිමත්ව, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(8) මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට, අවසර නොලබා නොපැමිණ සිටින යම් පත් කළ සාමාජිකයකු ඔහුගේ ධුරය හැර යන ලද සේ සැලකිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්.

**10.** (1) සභාපතිවරයා හෝ සභාපතිවරයා නොමැති අවස්ථාවේ දී උපසභාපතිවරයා මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා හෝ උප සභාපතිවරයා පැමිණ නොසිටියහොත් ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඒ රැස්වීමෙහි මූලාසනය දැරීම සඳහා තමන් අතුරෙන් සාමාජිකයකු නම් කළ යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක දී යෝජනාවකට පක්ෂ හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සමාන වුවහොත්, සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට, ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම් සභාපතිවරයා විසින් කැඳවනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන වාර ගණනක් පැවැත්විය යුතු ය.

(4) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(5) මණ්ඩලය විසින් එහි සාමාජිකයන්ට අදාළ විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව මණ්ඩලය විසින් තීරණය කරන පරිදි මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය හැක.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් එහි රැස්වීම් පැවැත්වීම පිළිබඳ සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

(7) මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාවේ යෙදීමේ දී, කාර්යය ඉටු කිරීමේ දී සහ කර්තව්‍ය කිරීමේ දී, අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි විධානවලට යටත්ව හා ඒ විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලයේ බලතල හා කාර්ය පැවරීම.

**11.** (1) මණ්ඩලයේ කවර හෝ බලතල සහ කාර්ය, මණ්ඩලය විසින් මණ්ඩලයේ සාමාජිකයකුට පවරා දෙනු ලැබිය හැකි ය.

(2) එසේ බලතල හා කාර්යය පවරා දෙනු ලැබුයේ යම් සාමාජිකයකුට ද ඒ සාමාජිකයා විසින් ඒ බලතල ක්‍රියාවේ යෙදීම සහ කාර්යය ඉටු කිරීම මණ්ඩලය විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි මණ්ඩලයේ පොදු හෝ විශේෂ විධානවලට යටත්ව කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකත්වයෙහි පුරප්පාඩුවක් තිබීමේ හෝ සාමාජිකයකු පත්කිරීමෙහිලා දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කටයුතු නිර්බල නොවිය යුතු බව.

**12.** මණ්ඩලයේ සාමාජිකත්වයෙහි යම් පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට 10 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ක්‍රියා කිරීමට බලය ඇති අතර, එවැනි යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ මණ්ඩලයේ සාමාජිකයකු පත්කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ කිසි ක්‍රියාවක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව.

**13.** මණ්ඩලයේ මුද්‍රාව—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් අනුමත කරන ලද ආකෘතියකට අනුව විය යුතු අතර, මණ්ඩලය නිශ්චය කරන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර කිසි ලේඛනයක නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සංකේතයක් වශයෙන් ඒ දෙදෙනා එහි අත්සන් තැබිය යුතු ය.

**ආයතනයේ කාර්ය මණ්ඩලය**

ආයතනයේ කාර්ය මණ්ඩලය.

**14.** මේ පනතේ සහ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට යටත්ව—

(අ) ආයතනයේ නිලධරයන් හා සේවකයන් පත් කිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන්ගේ විනය පාලනය;

(ආ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ වැටුප් හෝ වේතන හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(ඇ) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි තීරණය කිරීම; සහ

(ඈ) එම කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය පිණිස යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කිරීම,

සඳහා මණ්ඩලයට බලය ඇත්තේ ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

**15.** (1) මණ්ඩලය විසින් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. ඔහුගේ ධුරකාලය අවුරුදු තුනක් වන අතර, මණ්ඩලය විසින් තීරණය කරන පරිදි නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වේ.

(2) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි බලතල, කර්තව්‍ය සහ කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාවේ යෙදවීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් අධ්‍යක්ෂවරයන්, මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

තාක්ෂණ කමිටු පිහිටුවීම.

**16.** (1) මේ පනත යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය තාක්ෂණ කමිටු යම් සංඛ්‍යාවක් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් පත් කරනු ලබන යම් තාක්ෂණ කමිටුවක් විසින් මණ්ඩලය ඒ කමිටුවට දී තිබෙන නිර්ණේය විෂයයන්හි නියමිත පරිදි එහි කර්තව්‍ය කිරීම සහ එහි බැඳීම් ඉටු කිරීම කළ යුතු ය.

(3) එක් එක් තාක්ෂණ කමිටුවේ ධුර කාලය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවල දී එය නැවත සංස්ථාපනය කරනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් යම් අවශ්‍යතාවක් ඇතිවිට, තාක්ෂණ කමිටු සඳහා අදාළ ක්ෂේත්‍රයේ දැනුම හා පළපුරුද්ද ඇති යම් තැනැත්තෙක් තෝරාපත් කර ගනු ලබන සාමාජිකයකු ලෙස පත් කරනු ලැබිය හැකි ය.

(5) තාක්ෂණ කමිටුවක සාමාජිකත්වය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු ය; එනම් සේවකයන්ගේ නියෝජිතයෙක්, සේවායෝජකගේ නියෝජිතයෙක් සහ රාජ්‍ය අංශයේ නියෝජිතයෙක්.

(6) මණ්ඩලය විසින් එක් සාමාජිකයකු කමිටුවේ සභාපති ලෙස නම් කරනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් යම් තාක්ෂණ කමිටු සාමාජිකයකුට හෝ තෝරාපත් කර ගනු ලබන සාමාජිකයකුට ගෙවනු ලැබිය හැකි ය.

වෘත්තීය සමිති අධ්‍යයන අංශය පිහිටුවීම.

**17.** (1) (මෙහි මින් මතු "අධ්‍යයන අංශය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීය සමිති අධ්‍යයන අංශයක්, 4 වන උපවගන්තිය යටතේ දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයේ සඳහන් කරනු ලබන දිනයක සිට එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන්නේ ය.

(2) ඒ අධ්‍යයන අංශයෙහි අංශ ප්‍රධානියා ලෙස කටයුතු කළ යුතු අධ්‍යක්ෂවරයකු මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) අධ්‍යයන අංශයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන්, මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යයන අංශයෙහි අරමුණු පහත සඳහන් පරිදි වේ:—

(අ) වෘත්තීය සමිති සාමාජිකයන්, සේවකයන්, සේවා යෝජකයන්, සේවක හා සේවා යෝජක නියෝජිතයන් සහ රජයේ සේවකයන් සඳහා පුහුණුව සැපයීම;

(ආ) කම්කරු නීති, වෘත්තීය සමිති, මූල්‍යය, වාණිජ්‍යය, වෙළෙඳාම, භාණ්ඩ හා සේවා සැපයීම, කම්කරු කළමනාකරණය සහ මණ්ඩලයේ මතය පරිදි වෘත්තීය සමිති සංවර්ධනයට ඉඩ සලසන වෙනත් පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම.

(5) අධ්‍යයන අංශයෙහි අංශ ප්‍රධානියා සහ නිලධරයන් හා සේවකයන් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පොදු හෝ විශේෂ විධාන යටතේ ක්‍රියා කළ යුතු ය.

(6) මණ්ඩලය විසින් අධ්‍යයන අංශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍යය විය යුතුයයි ඔවුන්ගේ මතය වනවිට ප්‍රාදේශීයව අධ්‍යයන අංශයෙහි ශාඛා කවර හෝ සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකි ය.

රීති.

**18.** (1) රීති සෑදීමට මේ පනතින් බලය පැවරී ඇති හෝ නියමිත සියලු කාරණා හෝ යම් කාරණයක් සම්බන්ධයෙන් ආයතනය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ආයතනය විසින් සාදන ලද සෑම රීතියක්ම, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ගැසට් පත්‍රයේ පළකරනු ලබන තෙක්, බලාත්මක නොවිය යුතු ය.

ආයතනයට කරනු ලබන සේවය ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා සලකනු ලැබිය යුතු බව.

**19.** යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරන ලද යම් සේවා කාලසීමාවක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ කාර්යය මණ්ඩලයට රජයේ නිලධරයන් පත් කිරීම.

**20.** (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවයෙහි නියුක්ත රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සහ ඒ නිලධරයාගේ එකඟත්වය ඇතිව දෙනු ලැබූ, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ ඒ නිලධරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## මුදල්

**21.** (1) ආයතනයට ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ අරමුදලට—

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල්;

(ආ) ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල්; සහ

(ඇ) ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර හෝ ප්‍රභවයකින් ආයතනය වෙත ලැබෙන සියලු මුදල්,

බැර කරනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ අරමුදලින්—

(අ) මේ පනත යටතේ, ආයතනයේ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී, ආයතනය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

**22.** ආයතනයේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය. ආයතනයේ මුදල් වර්ෂය.

**23.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන ආයතනයේ ගිණුම් විගණනය කිරීම කෙරෙහි හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. ගිණුම් විගණනය.

### පොදු විධිවිධාන

නියෝග.

**24.** (1) නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති හෝ නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ ඒ නියෝගයෙන් නිශ්චිත වූ නියමිත යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ආයතනය විසින් යම් තැනැත්තකුගේ වියදම් දැරිය යුතු බව.

**25.** යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලබන යම් නඩුවක දී ඒ තැනැත්තා විසින් දරනු ලබන යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**26.** ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

**27.** ආයතනයේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ආයතනයේ නිලධරයන් සහ සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**29.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"ශ්‍රම අධ්‍යයනය" යන්නට කාර්මික සම්බන්ධතා, ජාතික හෝ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිති, කම්කරු නීති, වෘත්තීය සමිති, සේවක-සේවා යෝජක සම්බන්ධතා, සේවා යෝජක - සේවා නියුක්තික නියෝජනය හෝ සංවිධානය කම්කරු අධ්‍යාපනය, මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධන පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, ඵලදායිතාව, නිෂ්පාදනය, වෙළෙඳ අලෙවි කටයුතු, සමාජ සංවර්ධනය හා කම්කරු ආර්ථික විද්‍යාව පිළිබඳ යම් අධ්‍යයනයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක්, පර්යේෂණ උපදේශක සේවා, සමීක්ෂණ, සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන, පුහුණු පාඨමාලා හෝ ඒ සමාන වැඩ කටයුතුවලට අදාළ විෂයයක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් විෂයයක් ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.